# PiNK

අම්මටයි - දුවටයි

pink womens magazine

www.pinkline.lk

2023 නොවැම්බර් 10වැනි සිකුරාදා
පළමු බාණ්ඩය
හතලිස් හතරවැනි කළාපය.



**DRESS BY**
*LSALON HIRUNI & SAREES*

**PHOTOGRAPHER -**
*BHUMI WICKRAMASINGHE PHOTOGRAPHY*

**OUTFIT DESIGNER**
*CR CLOTHING BY CHAMARI*

**NAILS**
*DILANMO NAILS*

කාන්තා සැමට
නොමිලේ පිදෙන
ලෙන්ගතුම තිළිණය

## Yohani Hettiarachchi

**ශ්‍රී ලංකාවේ වැඩිමදෙනා කියවන ඩිජිටල් කාන්තා පුවත්පත**

# මේ හැමදේම
# නොමිලේම දෙන්නේ ඇයි?

ලෝකය කාලෙන් කාලෙට ඉක්මනින් දියුණු වෙමින් පවතිනවා.ඒ දියුණු ලෝකයට තත්පරයෙන් තත්පරයට විවිධ අලුත් තාක්ෂණික අංග එක් වෙනවා.ඒ සියලුදේ එක්ක අලුත් වීම අපේ ජීවිතයේත් දෛනික කටයුත්තක් බවට පත්වෙලා.

මේ දියුණු ලෝකේ කාන්තා සැමට එක ලෙස එකට හිඳ රස විඳින්නට හැකි තිළිණයක් විදියට ඔබේ අතට පත්වෙන මේ ඩිජිටල් පුවත්පත හඳුන්වන්න පුළුවන් අපි මේ හැමදේම ඔබට නොමිලේ තිළිණ කරන්නේ අපේ වටිනාම වස්තුව ඔබ නිසාමයි.

නොමිලේ ඔබට ලැබෙන මේ ඩිජිටල් පුවත්පත බුද්ධිමත්ව භාවිත කරන්න.තවත් කෙනකුගේ පරිශීලනය වෙනුවෙන් බෙදාහරින්න.අපි අපේ ලෝකය තව ලස්සන කරමු

ශර්මිලා ප්‍රනාන්දු
ප්‍රධාන කතෘ
+94 71 686 1825



PiNK
අම්මටයි දුවටයි
බුද්ධිමත් කාන්තාවන්ගේ ඩිජිටල් පුවත්පත



## ජාවාරම්කරුවන්ට හසුනොවී
## වැදගත් විදිහට වැඩ ටික කරගෙන

# සතුටින්
# රට යන්න

රට යනකොට කතා කරන්න **1989**

www.slbfe.lk

කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය · ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

**යොහානි හෙට්ටිආරච්චි කියන්නේ අදවනවිට ශ්‍රී ලංකාවේ ජනප්‍රියත්වයට පත් දක්ෂ රංගන ශිල්පිනියක්.ලැබෙන සෑම චරිතයකටම උපරිමයෙන් සාධාරණයක් ඉටු කරන ඇය ඒ නිසාම කා අතරත් ප්‍රකටයි.මේ ඇය සමඟ අපි කළ කතා බහක්**

**ඕනෑම ගැහැණු දරුවකුට මව තරම් යෙහෙළියක් ලොවේ කොතැනකවත් නොමැති තරම්. එහෙනම් අපි "අම්මා" ගැන මතක් කලොත්?**

ඕනෑම ගැහැණු ළමයෙකුගේ පිටුපසින් මවක් අනිවාර්යයෙන්ම සිටිනවා. එය කාටත් පොදුයි. අම්මා තමයි මගේ මේ ක්ෂේත්‍රයට උපරිම සහයෝගයක් ලබා දෙන්නේ. ඇය රංගනය ක්ෂේත්‍රයෙන් කවදාහරි මම ඉදිරියටම යන්න ඕනෑ කියන එක තමයි ඇයගේ සිහිනය, නිතීරිතී නැතිවම නොවෙයි.

**මේ වෙද්දී ඔබ රංගනයෙන් දායක වුනු සිනමා සහ ටෙලිනාට්‍ය නිර්මාණ මොනවාද?**

# අභියෝගවලට අභියෝගයක් වුණොත් ජීවිතේ දිනුම්

**ඉතින්, යොහානී, කොහොමද මේ දවස්වල වල ගෙවන ජීවිතය?**

මේ දවස්වල ඉතින් මම රගපෑමේ කටයුතු වල නිරත වෙන අතර ඉගෙනීමේ කටයුතුත් සමබරව කරගෙන යනවා.

**ඔබ ඉතාමත් කුඩා වයසකදීම මිනිසුන් අතර ජනප්‍රිය තරුවක් බවට පත්වුනා එහෙම නේද?**

මම මේ ක්ෂේත්‍රයට එන්නේ හුගාක් පුංචි වයසේදී. නාලන් මෙන්ඩිස් මහත්තයාගේ "අංගනාවෝ ටෙලිනාට්‍යය, ඒවගේම මීට කලින් මම සිරස නාලිකාවේ විකාශනය වුනු 'පුංචි පැංචි' වැඩසටහන මෙහෙව්වා, මේක තමයි මගේ මුලාරම්භය. දැන් දැන් තමයි අත්දැකීම් ජීවිතයට එකතු කරගෙන යන්නේ.

**පෞද්ගලික ජීවිතයේ තොරතුරු ගැන සදහන් කලොත්?**

පෞද්ගලික ජීවිතය ගැන කිව්වොත්, මම රංගනය සහ ඉගෙනීම් කටයුතු, හැමදේම හොදින් balance කරගෙන පවුලේ අයගේ සහයෝගය ඇතිව ජීවිතයට හොදින් මුහුණ දෙනවා.



මම මේ වෙද්දී චිත්‍රපට 10ක් සහ ටෙලිනාට්‍ය 12 ක් කරලා තියෙනවා. චිත්‍රපට ගැන කතා කලොත් ඇහැළේපොළ කුමාරිහාමි, ආලෝකෑඋදපාදී, සිංහයා, පුංචි අන්දරේ, නිහඩ සෙවණැලි, Happy Birthday, අලි කතාව වැනි චිත්‍රපට සදහන් කරන්න පුළුවන්. ටෙලිනාට්‍ය ගැන කතා කලොත් සිහින ගෙනෙනා කුමාරියේ, අංගනා, රාවණා, අඳුන් ගිර වැනි ටෙලිනාට්‍ය සදහන් කරන්න පුළුවන්.

**ඔබට රංගනයෙන් දායකවීමට තවමත් නොලැබුණු එහෙත් කැමැත්තක් තිබෙන චරිතයක් තියෙනවාද?**

මම හුගාක් විවිධත්වයෙන් යුතු චරිත රගපාලා තියෙනවා. නමුත් මට එක චරිතයක් කියලා කියන්න බැහැ. මම හැම චරිතෙකටම ආදරෙයි. මම මොනවගේ කෙනෙක් කෙනෙක් වුනත් හැම මිනිසකුටම එක සමාන ආදරයක් දක්වනවා. ඒවගේම මට ලැබෙන හැම චරිතයක්ම මම ආදරයෙන් බාර ගන්නවා. එහෙම මේ චරිතය තමයි මට ඕනා, කියන මතයේ මම නැහැ.

**ජීවිතයට පැමිණි අභියෝග මොනවාද?**

මගේ ජීවිතයට නම් අභියෝග හුගාක් ඇවිල්ලා තියෙනවා. මගේ පුංචි වයසට මගේම පවුල් පසුබිමින් පැමිණි ප්‍රශ්න, ඒවත් එක්කම සමාජයෙන් පැමිණි

ප්‍රශ්න, ඒ සියළුම ප්‍රශ්නත් එක්ක මම හුගාක් අභියෝග වලට මුහුණ දීලා තියෙනවා. ඒ හැමදේම සුබවාදීව තමයි මම හිතන්නේ.

**යොවුන් අවදියේ සිටන තරුණියක් විදියට ආදරය ගැන දැනෙන, හැගෙන දේ?**

ආදරය ගැන කිව්වොත් ආදරය හැමෝටම අවශ්‍ය දෙයක්, හැබැයි කුමන වයසකදී ආදරය කලත්, නිවැරැදි පුද්ගලයා ජීවිතයට හමුවුනොත් හොදයි.

මම නම් තාම ආදරය හොයන්න යන්නේ නැහැ දැන්, මොකද මට නිවැරදි පුද්ගලයා හමුවුනේ නැතිනම්, මගේ වයසත් එක්ක සහ මගේ වැඩකටයුතුත් එක්ක ආදරය ප්‍රශ්නයක් වෙන්නත් පුළුවන්. දැනට මම නිරත වෙලා ඉන්න වැඩ කටයුතු ටික කරගෙන, ආදරය අවශ්‍ය කාලයේදී එය **focus** කරගෙන, හොද හෝ නරක භාර ගන්න පුළුවන් විදිහට තමයි ආදරය කරන්න ඕනා කියලා මම හිතන්නේ.



**ඔබ *FASHION* වලට කැමැත්තක් දක්වනවා නේද?**

මම **Fashion** වලට ලොකු කැමැත්තක් දක්වනවා. හැබැයි **Fashion** කරද්දී මගේ යම් යම් සීමා තියෙනවා.

**Fashion** වලට තියෙන කැමැත්ත නිසාම මම **Clothing Brand** එකක් දැනට කරගෙන යනවා . එහිදී මට නොගැලපෙන **Fashion** තියෙනවා නම්, මම ඒක අනික් අයට අන්දවලා බලනවා ගැලපෙනවාද කියලා,

ඉන්පසු ඒ අයව **photo shoots** කරනවා. ඇත්තෙන්ම මම හුගාක් **Fashion** වලට කැමති කෙනෙක්, මට නොගැලපුනත් එය තවත් කෙනකුට අන්දවලා සතුටු වෙන්න පුළුවන් නම්, ඒක තමයි **Fashion** කියන්නේ. තෝරා බේරා ගෙන තමන්ට සුදුසු, ගැලපෙන **Fashion** කරනවා නම් තමයි හොද.




**යොහානි, කාන්තාවන් වු පමණින්ම ඇය ආර්ථිකමය වශයෙන් ස්ථාවර විය යුතුමද?**

කාන්තාවක් වු පමණින්ම ආර්ථික වශයෙන් ස්ථාවර වියයුතුයි කියලා මම කියන්නේ නැහැ.
නමුත් කාන්තාවක් ආර්ථික වශයෙන් ස්ථාවර මට්ටමක නැතිවුනොත් ඇය මානසික මට්ටමින් ඇය ස්ථාවර විය යුතුයි. මන්ද, තනිවම ජීවත් වීමේ හැකියාව ඇය සතු විය යුතුයි. ලංකාව වැනි රටක කාන්තාවකට හෝ යෞවන අවධියේ සිටින ඕනෑම ගැහැණු දරුවෙකුට ආත්ම ශක්තියක් තියෙන්න ඕනා, සමාජයත් එක්ක ගැටෙන්න.


මම කියන්නේ, තමන්ට පුළුවන් විදිහට ඉපයුම් මාර්ග යක් හදා ගන්න ඕනා. ඕනෑම කාන්තාවක් ඒ සදහා හැඩගැහෙනවා නම් හොදයි කියලයි මට හිතන්නේ.




**ඔබ සුරතල් සතුන්ට විශේෂ කැමැත්තක් දක්වනවා නේද?**

මම සතුන්ට හුගාක් කැමතියි, සුරතල් සතුන් කියලා වර්ගීකරණය කරන්න බැහැ. මම ඒ අය ගැන හොදින් අධ්‍යයනය කරනවා. ඔවුන් සමග කාලය ගත කිරීමත් හරිම සුන්දරයි.

**ෂමිලා ප්‍රසංගනී ප්‍රනාන්දු**




| PHOTOGRAPHY | DRESS BY | OUTFIT DESIGNER | NAILS |
|---|---|---|---|
| BHUMI WICKRAMASINGHE | SALON HIRUNI & SAREES | CR CLOTHING BY CHAMARI | DILANMO NAILS |


RICHMASS FASHION
හැමෝම කැමති
හැමෝම සොයන
හැමෝගේම
නිදහසේ
විලාසිතාව
RICHMASS
KINGDOM OF FASHION
රාගම
0112 958 210

# ගින්නෙන් උපන් සීතල පිණිකැටය

# මලාලාගේ කතාව

**මලාලා උපත ලැබුවේ 1997 ජුලි 12 වැනි දින පාකිස්ථානයේ පහළ මධ්‍යම පාන්තික පවුලක ය. ඇයගේ පවුල යුසුෆ්සායි ගෝත්‍රයට අයත්, පෂ්තුන් වාර්ගිකයේ සුන්නි මුස්ලිම් වේ.**

පාකිස්තානයේ ඇතැම් ප්‍රදේශ වල තලේබාන්වරුන් විසින් සිය ආධිපත්‍යය පතුරුවා තිබූ අතර ඔවුන් එහිදී ගැහැනු ළමයින්ට පාසල් යාම තහනම් කර තිබිණි.

ඇය විසින් කුඩා කල සිටම ජීවිතය, සමාජ ප්‍රශ්න පිළිබද සිය අදහස් නිර්ණාමිකව බ්ලොග් අඩවි ඔස්සේ පළ කරන්නට විය. විශේෂයෙන් ම එහිදි ඇය විසින් එවක සමාජයේ ගැහැනු ළමයින්ට හිමි වූ ස්ථානය,මෙන්ම ගැහැනු ළමයින්ගේ අධ්‍යාපනය ලැබීමේ අයිතිය පිළිබඳ සමාජ කතිකාවතක් ගොඩනැගුවාය.

මෙලෙස මලාලා තනිව සමාජ මතය වෙනස් කිරීමට උත්සහ ගැනීමත් සමග කුඩා දැරියක වුවත් ඇයට මුහුණ දීමට සිදු වූ අන්තරායන් සුළු පටු නොවීය. ඇයට දිගින් දිගටම මරණ තර්ජන පවා එල්ල වන්නට විය. ඒ අනුව 2012 වසරේ දී තලේබාන් නායකයන් විසින් ඇයව මරා දැමීමට ඒකමතිකව තීරණය කෙරිණි.

පාසල් යාමට අධිෂ්ඨාන කරගෙන අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය පිළිබඳ දැඩි විශ්වාසයකින් යුතුව මලාලා තලේබාන් සංවිධානයට එරෙහිව නැගී සිටියාය. ඇගේ පියා සමඟ මලාලා ඉක්මනින් ඔවුන්ගේ උපක්‍රම විවේචනය කරන්නියක් බවට පත් විය. ”තලිබාන්වරු මගේ මූලික අධ්‍යාපනයේ අයිතිය උදුරාගන්නේ කොහොමද?” ඇය වරක් පකිස්තාන රූපවාහිනියට පැවසුවාය.

මලාලා සිය පළමු BBC දිනපොත සටහන ලියන විට ඇයගේ වයස අවුරුදු 11 කි. ”මට බයයි” යන බ්ලොග් ශීර්ෂය යටතේ ඇය ඇගේ සුන්දර ස්වාත් නිම්නයේ පූර්ණ යුද්ධයක් ගැන ඇති බිය සහ තලේබාන් නිසා පාසල් යාමට බිය වීම පිළිබඳ බියකරු සිහින විස්තර කළාය.

2012 ඔක්තෝබර් 09 වැනිදා පාසල් නිම වී බස් රථයකින් නිවෙස බලා යන අතර තලේබාන් තුවක්කුකරුවෙක් බස් රියට ගොඩ වී ඒ වන විට වයස අවුරුදු 15 ක් තරම් කුඩා දැරියක් වූ මලාලාට ඔවුන් වෙඩි තැබුවේය. වෙඩි උණ්ඩය වම් ඇසේ පැත්තෙන් ඇගේ බෙල්ල හරහා ගමන් කර උරහිසට එල්ල විය. ඇයව රෝහල් ගත කළ අතර පසුව ඇය පිළිබදව ලෝකය පුරා කතාබහට ලක් විය.

ඒ අනුව වැඩි දුර ප්‍රතිකාර සඳහා ඇයව එංගලන්ත රජය විසින් එරටට රැගෙන ආ අතර මලාලාගේ ආරක්ෂාව සඳහා එහි සුරැකිව තබා ගන්නා ලදී. පසුව ඇය එංගලන්තයේ සිට නැවතත් කාන්තා නිදහස, ගැහැනු ළමයින්ගේ අධ්‍යාපන අයිතිය පිළිබඳ හඬ නගන්නට විය.

කාන්තා අධ්‍යාපනය වෙනුවෙන් හඬනැගූ ක්‍රියාකාරිනියක වන ඇය ළමයින් සහ තරුණයන් මර්දනයට එරෙහිව සහ සියලුම දරුවන්ගේ අධ්‍යාපන අයිතිය වෙනුවෙන් සහ ඇය කළ අරගලය



වෙනුවෙන් 2014 ඔක්තෝබර් 10 වන දින ලොව ළාබාලතම නොබෙල් සාම ත්‍යාගලාභිනිය ලෙස මලාලා ප්‍රකාශයට පත් කරන ලදී.

එසේම නොබෙල් ත්‍යාගයක් ලැබූ දෙවන පාකිස්ථානු ජාතිකයාද වේ. මලාල ගෙන ගිය තනි සටන් ව්‍යාපාරයට ලොව වටා පිරිස් එකතු වන්නට විය.

මලාලා අරමුදල පිහිටුවා එමගින් ගැහැනු ළමයින්ට නොමිලේ, ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීමට ඇය විසින් කටයුතු කරනු ලබයි.

තවද මලාලා අධ්‍යාපන අරමුදල් ව්‍යපාරයෙන් අධ්‍යාපනඥයන්ගේ සහ උපදේශකයන්ගේ කාර්යයට සහය වන අතරම ලොව පුරා ගැහැනු ළමයින්ගේ ද්වීතියික අධ්‍යාපනය ඉහළ නැංවීමටද යොදා ගනු ලබයි.


ඇය පවසන්නේ ගැහැනු ළමයින්ගේ හඬ වැදගත් අතර සිය දහස් ගණනක් මලාලාවන් එහි සිටිය හැකි බවයි.


කාන්තාවක් ලෙස අයිතීන් වෙනුවෙන් හඬ නගන ආකාරය පෙන්නු ඇය අනිත් කාන්තාවන්ටද ආදර්ශයක් වූවාය.

සමාජ දුර්මතයන්ට බයේ මිරිකී නොසිට කාන්තාවට ඉදිරියට පැමිණීමට ඇගේ කතාව හොඳ උදාහරණයකි.

දැරියන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් සටන් වදින පාකිස්තාන ජාතික ළමා ක්‍රියාධාරිනියක වන මලාලා යූසුෆ්සායි එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ලාබාලතම සාම දූතවරිය ලෙස නම් කරනු ලැබ තිබේ.

**නිරෝෂා සඳමාලී**
**ජනසන්නිවේදන අධ්‍යන අංශය**
**කැළණිය විශ්වවිද්‍යාලය**








ஏமாற்றுக்காரர்களிடம் அகப்படாமல்
கௌரவத்துடன் வேலைகளை
செய்து கொண்டு

# சந்தோசமாய்
# வெளிநாடு
# செல்லுங்கள்

நீங்கள் வெளிநாட்டு வேலைக்கு செல்வது உங்களினதும் உங்கள் அன்பிற்குரியவர்களினதும் கனவுகளை நனவாக்கி வாழ்க்கையை வளமாக்கவே. அப்படி செல்லும் பயணம் கௌரவமான முறையில் வெளிநாட்டு வேலை வாய்ப்பு பணியகத்துடன் பதிந்து செல்ல முடியுமாயின் உங்கள் பாதுகாப்பு மற்றும் உங்கள் தொழில் பாதுகாப்பு உள்ளிட்ட நம்பிக்கையோடு சந்தோசமாய் செல்லலாம்.

வெளிநாடு செல்லும் போது அழையுங்கள் **1989**

இலங்கை வெளிநாட்டு வேலைவாய்ப்பு
பணியகத்தில் பதிவு செய்திடுங்கள்

www.slbfe.lk

தொழில் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்பு அமைச்சு - இலங்கை வெளிநாட்டு வேலைவாய்ப்பு பணியகம்

**අප සමාජය තුළ ජීවත් වන විට අපට විවිධ බාධක කම්කටොළු එන්නට පුළුවන. විශේෂයෙන් කාන්තාවකට එවැනි බාධක බොහෝමයකට මුහුණ දෙන්නට සිදු වේ.**

නමුත් එම බාධක තමන්ගේ සාර්ථකත්වයට බාධාවක් නොවන ලෙස මනා පෞරුෂත්වයකින් යුක්ත ව ජීවත් වීම කාන්තාවකට ඉතාමත්ම වැදගත් වේ. මේ නිසා කාන්තාවක් ලෙස සමාජය ඉදිරියේ බලගතු චරිතයක් බවට පත් වීමට අවශ්‍ය වේ.

# සමාජයේ FORWARD චරිත වෙන්නේ කොහොමද ?



**අධ්‍යාපනයෙන් හා දැනුමෙන් සන්නද්ධ වන්න.**

අද වන විට විවිධ ක්ෂේත්‍රයන් ගණනාවක් පවතින අතර එම එක් එක් ක්ෂේත්‍රයන්ගෙන් තමන්ට අවශ්‍ය දැනුම ලබා ගැනීමට හැකියාව පවති. එමෙන්ම තමන්ගේ අධ්‍යාපන සුදුසුකම් ආදිය වර්ධනය කර ගැනීම ද සිදු කළ හැකිය. වර්තමානයේ විවිධ ඩිප්ලෝමා හා පාඨමාලා ගණනාවක් පවතින අතර ඒ හරහා සිය දැනුම වර්ධනය කර ගැනීමට හැකියාවක් ඇත. මන්දයත් අධ්‍යාපනය අද සමාජයේ අත්‍යවශ්‍යම සාධකයක් වන නිසාවෙනි.

ආත්ම විශ්වාසය ඇතිකර කර ගන්න.ඔබේ හැකියාවන් පිළිබඳ ඔබ තුළ විශ්වාසයක් පැවතීම ඉතාමත්ම වැදගත් වේ.

එමෙන් ම ආත්ම විශ්වාසයෙන් ක්‍රියා කිරීම තුළින් ඔබට ඇති බාධා ආදිය ද බිඳ දැමීමට ද හැකියාවක් ලැබෙනු ඇත.එමනිසා ආත්ම විශ්වාසය ඔබ සතු වටිනාම අවිය වේ.

**ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගෙන් උපදෙස් ගන්න.**

ඔබ සිදු කිරීමට බලාපොරොත්තු වන රැකියාවෙන් ඔබට ඉදිරියට යාමට හා අලුත් දෙයක් ආරම්භ කිරීමට අවශ්‍යතාවය පවතී නම් එයට ඔබට උපදෙස් ලබා ගැනීමට සිදු වේ.

ඒ සඳහා ඔබට කළ හැකි හොඳ ම දෙය වන්නේ එම අදාල ක්ෂේත්‍රයන්ගෙන් සාර්ථකත්වයට පත් වූ අයගෙන් උපදෙස් ලබා ගැනීම ය.

එමගින් ඔබට නිවැරදි මග පෙන්වීම ලැබෙනු ඇත.
අයිතිවාසිකම් හා අසා අසාධාරණකම් වෙනුවෙන් පෙනී සිටින්න.

ඔබේ පෞද්ගලික ජීවිතය තුළ ඔබට පැන නැගෙන විවිධ බාධක තත්ත්වයන් හා අසාධාරණකම් හමුවේ නොබියව පෙනී සිටිය යුතුය. මෙලෙස නොබියව මුහුණ දීමෙන් ඔබේ ආත්ම පෞරුෂයන් ද වර්ධනය වනු ඇත. එය සමාජය තුළ ඔබ කැපී පෙනෙන චරිතයක් වීමට මග පෙන්වනු ඇත. නායකත්වයන් දරන්න.

ඔබේ සේවා ස්ථානයේ , ප්‍රජාව අතර හෝ වෙනත් සංවිධානවල විවිධ නායකත්ව භූමිකාවන් හා වගකීම් ආදිය භාර ගැනීමට බිය විය යුතු නැත.

මන්දයත් නායකත්වය ඔබගේ ප්‍රතිරූපය සමාජය හමුවේ තව තවත් ඔප් නැංවීමට හැකියාව ලබා දෙන හෙයිනි.

**මතයන් ඉදිරිපත් කරනන්නට බිය නොවන්න.**

ඔබ යම් දෙයක් පිළිබඳව වෙනත් අදහසක් හෝ මතයක් දරනවා නම් එම මතය අන් අය ඉදිරියේ ඉදිරිපත් කිරීමට නොපැකිලි විය යුතුය.

අන් අය ඔබ පිළිබඳ සිතන දේ පිළිබඳව කනස්සලු නොවිය යුතුය. එය ප්‍රසිද්ධ කතා කිරීම්, ලිවීම් මගින් හා සමාජ මාධ්‍ය හරහා ද අන් හය හමුවේ ඔබගේ අදහස් බෙදා ගැනීමටද හැකියාවක් ඇත.

උත්සාහය අත් නොහරින්න.

ඔබට කාන්තාවක් වශයෙන් සමාජ තලය තුළ කටයුතු කිරීමේදී විවිධ අභියෝගයන්ට මුහුණ දෙන්නට සිදු වේ.

ඇතැම්විට එම අභියෝග හමුවේ ඔබ පසුබෑමට පවා ලක් විය හැකි ය. නමුත් එම අභියෝග ඔබගේ ජීවිතයේ සාර්ථකත්වයට උත්තේජනයක් කර ගත යුතු ය.

එමනිසා අභියෝග හා බාධක ජය ගැනීමට ඔබගේ උත්සාහය අත් නොහැර තබා ගත යුතු ය.

**සමබර වන්න.**

ඔබගේ පෞද්ගලික ජීවිතය හා ඔබගේ වෘත්තීය කිසිවිටෙකත් පටලවා ගනිමින් කටයුතු නොකළ යුතු ය.

ඔබගේ එම භූමිකාවන් ද්විත්වය දෙයාකාරයෙන් මෙහෙයවීමට පුරුදු විය යුතු ය.

නිරතුරු පෞද්ගලික ජීවිතය හා රැකියාව සමබරව තබා ගනිමින් කටයුතු කළ යුතු ය.

අන් අයට ආදර්ශයක් වන්න. අන් අයට ධනාත්මක හා ආදර්ශමත් ලෙස කටයුතු කරන්නියක් වශයෙන් ක්‍රියා කළ යුතු ය.

එවිට ඔවුන්ගේ පරමාදර්ශී චරිතය ඔබ විය හැකි ය. එය ඔබගේ පෞරුෂය තවත් ඔප් නැංවීමට ආභරණයක් වනු ඇත.

සමාජය ඉදිරියේ කැපී පෙනෙන පෞරුෂයකින් හෙබි කාන්තාවක් වීමට වෙර දරන්නියකට මග පෙන්වීමක් අවශ්‍ය වන අතර මෙය ඒ සඳහා ඇයට මහඟු පිටිවහලක් වන බව නොඅනුමානය.

ඔබත් කාන්තාවක් වශයෙන් ඔබගේ ජීවිතය සමාජයේ ඉදිරියට යන ක්‍රියාකාරී චරිතයක් බවට පත් කිරීමට වෙහෙස විය යුතු ය. එය ඔබට රන් අබරණයක් වනවා නිසැක ය.

**හංසිකා ලියනගේ**
**ජනසන්නිවේදන අධ්‍යයන අංශය**
**කැලණිය විශ්වවිද්‍යාලය.**



# IMPORTERS AND DISTRIBUTORS OF ALL KINDS OF BALL & ROLLER BEARINGS

NTN NSK NACHi FAG Koyo INA SKF TIMKEN IKO



# PRIME TRADING HOUSE

0760 288 412 / 0769 797 004
231,10A,Panchikawatta Road,Colombo - 10,Sri Lanka
prm.tradinghouse.sales@gmail.com



# ලෙහෙන්ගා විලාසිතාවෙන් හැඩවූ
# හැඩකාරි කවිහාරි

**PHOTOGRAPHY**
KANCHANA BANDARA
STUDIO PRIME FOCUS

**HMUA**
SUMALI RUPASARI
RUPASARI BRIDAL & BEAUTY SALON
0777 40 57 05

**OUTFIT, JEWELLERY**
THARINDRA NISHADHI FONSEKA
SHYAMA TAILORS

**මෙවර සුන්දර මනාලිය ලෙස *PINK* හැඩ කරන්නේ නවක මෝස්තර ශිල්පිනියක වන උච්චනා රවිහාරි විසිනි.**

ඇය මෙලෙස සුන්දර මනාලියක ලෙස හැඩ ගන්වනු ලැබුවේ ප්‍රවීණ රූපලාවණ්‍ය ශිල්පිනී අලච්ච රූපසාරි **bridel and beauty salon** හි සුමාලි රූපසාරි පින්ගමගේ විසිනි. රූපලාවණ්‍ය ශිල්පිනියගේ අවශ්‍යතාවයට අනුව ඇඳුම නිර්මාණය කර තිබුණේ **shyama tailors** හි තරින්ද්‍රා නිශාලි ෆොන්සේකා විසිනි.

රවිහාරිගේ සුන්දර රූ සපුව මෙලෙස හිත් ඇද බැඳ තබනා ලෙස ඡායාරූප ගත කරනු ලැබුවේ **studio prime focus** හි ඡායාරූප ශිල්පී කාන්චන බණ්ඩාර විසිනි. ඔබේ සුන්දර දිනය මෙලෙස හැඩ කරගැනීමට මෙම නිර්මාණශීලී කණ්ඩායම ඔබටද එක් කර ගැනීමට හැකිය.


දැන් අපි හැරෙන්නේ රවිහාරි හැඩ කළ ඒ මනරම් විලාසිතාවේ අන්තර්ගතය වෙතටය.

ඉන්දියානු විලාසිතා සම්ප්‍රදායට අනුව ලෙහෙන්ගා මනාලියක ලෙස හැඩ කළ රවිහාරි හැඩ කිරීම සඳහා මෙම ඇඳුම් මෝස්තරයට බටහර සම්ප්‍රදායද මිශ්‍රව භාවිතකොට තිබීම සුවිශේෂීත්වයකි.

ගොයින් අවේ සහ හෝම් කමින් එක සඳහා උචිත මෙම විලාසිතාව සඳහා  ඇඳුමේ වර්ණයට අදාල සරල මේකප් එකක් යොදා ඇත.

මෙහිදී අයි ශැඩෝ එක සඳහා පින්ක් කලර් යොදාගෙන ඇත. හෙවි අයි ශැඩෝ එකක් යොදා ගැනීමෙන් ඇගේ මුහුණේ ඉරියව් හොඳින් ඉස්මතු වී ඇත.









ඇයගේ තොල් ආලේපනයට යොදාගෙන ඇත්තේ සමේ වර්ණ යට ආසන්න රෝස පැහැයට ආසන්න වර්ණයකි.

ඉතාමත් පහසු කොණ්ඩා විලාසිතාවක් මේ සඳහා භාවිත කර ඇති අතර තනි තැල්ල යෙදීම සඳහා කොණ්ඩය මැදින් බෙදා දෙපස කොටස කර්ල් කොට හැඩ ගන්වා ඇත.

ඇඳුම් නිර්මාණය කිරීමේදී ශෝල් එක හරහා ඉන්දියානු සම්ප්‍රදායට සමාන විලාසිතාවක් භාවිත කොට ඇත.

එමෙන්ම බටහිර විලාසිතා ක්‍රමවේදයේ ඇතැම් දේ සම්මිශ්‍රණය කළ මෙම ඇඳුම් විලාසිතාව ඇයගේ රූ සපුව පිළිබඳ කළ අධ්‍යනයකට අනුව නිර්මාණය වූ එකක් වීමද සුවිශේෂීත්වයකි.

ලෙහෙන්ගා සාය කොටස ෆිෂ් ටේල් ආකාරයට නිර්මාණය කර ඇති නිසා ඇගේ උකුලේ හැඩය මනාව ඉස්මතු වී සුන්දර පෙනුමක් ලැබී ඇත.

සාය කොටසත් හැට්ටය කොටසත් නිර්මාණය කිරීමේදී බීඩ්ස්, පර්ල් සහ ක්‍රිස්ටල් එකතුකර ගෙන ඇත.

මෙම සුන්දර මනාලිය හැඩ හැන්වීමේදී භාවිතකොට ඇති ආභරණ ද විශේෂත්වයක් උසුලයි.

මෙම මනාලියගේ හැඩහුරුකම් අනුව නිර්මාණය කළ මෙම ආභරණ ඉන්දියානු ලෙහෙන්ගා සම්ප්‍රදායට සමාන බටහිර විලාසිතාවන්හි ඇතුළත් අංගද එක් කරගත් සුන්දර නිමැවුමකි.

මනාලියගේ සම්පූර්ණ තේමාව වන රෝස වර්ණයට අනුව කැපී පෙනෙන ආභරණ මේ සඳහා භාවිතකොට ඇත.

බොහෝදෙනා භාවිත නොකරන වෙනස්ම නිර්මාණශීලී ආභරණ මේ සඳහා යොදාගැනීම හරහා සුන්දර මනාලියගේ අලංකාරය තව තවත් ඔප් නංවා ඇත.


රූපලාවණ්‍ය ශිල්පිනිය,ඇඳුම් නිර්මාණ ශිල්පිනිය සහ ඡායාරූප ශිල්පියා එක්ව සාකච්ඡාකොට මෙම නිර්මාණය සැකසීම හරහා මෙලෙස සුන්දර මනාලියක් නිමවී ඇත.

බලන්න කවිකාර කවිහාරී ප්‍රවීණයන් විසින් තවත් කොතරම් සුන්දරකර ඇතිදැයි කියා.

**සමාධි විජේසූරිය**













# බතික් කලාවට නව අරුතක් දෙමින් MELI STORE විවෘතවුනු වගයි.







බතික් කලාවට නව අරුතක් දෙමින් නවීන බතික් විලාසිතා රැසකින් සමන්විත ඇදුම් විලාසිතාගාරයක් පසුගියදා "**MELI STORE**" නමින් කලුබෝවිල, සාරා සැලෝන් ස්ටුඩියෝ හී දී කලාතරු රැසකගේ සහභාගිත්වයෙන් විවෘත කරනු ලැබුවා.

මෙහිදී, ප්‍රවීණ චිත්‍රපට නිළි සංගීතා වීරරත්න, ප්‍රවීණ රූපලාවන්‍ය ශිල්පී චන්දිමාල් ජයසිංහ, ගායන ශිල්පිනී සමිතා මුදුන්කොටුව, ටෙලිනාට්‍ය හා චිත්‍රපට නිළි අනුරාධා, ගායන ශිල්පිනී නිරෝෂා විරාජිනි, 2023 ශ්‍රීලංකා විවාහක රූ රැජණ කිරුළ දිනූ ලක්ෂානී අබේසිංහ ආදී කලා ලොවේ බොහෝ ජනප්‍රිය අයගේ දායකත්වයෙන් ඉතාමත් සුබ මොහොතින් විවෘත වුනු "**MELI STORE**" විලාසිතාවන්ට පමණක්ම සීමා නොවී Dancing studio, saloon (Manicure & Pedicure) පහසුකම් ද ඔබට ලබාදී තිබේ.

ලග එන උත්සව කාලයට විශේෂිත වට්ටම් ක්‍රම ද හදුන්වා දී තිබීම මෙහි ඇති විශේෂත්වයයි.

**ෂමිලා ප්‍රසංගනී ප්‍රනාන්දු.**

**ඡායාරූප - විශ්ව තරංග**












ගම්පහ
උසම තැනින් රසම කෑම
Sky
LOUNGE
Experience the new taste
PickMe
Food
Uber
Eats
033 22 35 111
පවුලේ හැමෝටම
London Sky Lounge

# ඇස් ඇරගෙන නිදාගන්න ගිනිපිග් ගැන බය වෙන්න ඕනද?

**කලින් ලිපි වගේම රසබර ලිපියක් මෙවරත් ඔබ වෙත අරගෙන ආවා. අද කතා කරන්නෙ ගිනිපිග් සුරතලුන් ගැන රස රහසක්. ඒ තමයි එයාලගේ "නින්ද" ගැන. වෙන සතුන්ට වඩා ගිනිපිග් හරි වෙනස්. අලුතෙන්ම හදන්න බලාපොරොත්තු වෙන අයට ගොඩක් වැදගත් වේවි.**

ගිනිපිග් සුරතලුන් නිදාගන්නෙ ඉතාමත් අවම වශයෙන් (පැය 3-6 අතර වගේ)

නිදාගන්න හෝ විවේක ගන්න රැයක් දවාලක් නැහැ. අවශ්‍ය වෙලාවට විවේක ගන්නවා.

විනාඩි කීපයක් එකතැන ඇස් ඇරගෙන වගේ තමයි එයාලා නිතර නිදාගන්නෙ(ස්වභාවික පරිසරයෙ එයාලා විලෝපිකයන්ගෙන් ආරක්ෂා වෙන්නෙ එහෙමයි)

හැබැයි වටපිටාව හුරුයි නම්, එයාලට ආරක්ෂාව දැනෙනවා නම්, සුවපහසුව දැනෙනවා නම් හරහා වැටිලා හොදට නිදා ගන්නවා (ඇස් ඇරගෙන හෝ වහගෙන)

එයාලා ශබ්දයට ගොඩක් සංවේදී. ඒ නිසා සුළු දේටත් ගැස්සිලා, ඇහැරිලා බලනවා

හොදටම අයිතිකරුවන්ට හුරු ගිනිපිග් සතුන් අතේම වුණත් හාන්සි වෙලා ඉන්නවා

ඇස් ඇරගෙන හෝ වහගෙන, කූඩුවෙ හරහා වැටිලා ඉන්නකොට ගොඩාක් දෙනෙක් බය වෙනවා(ලෙඩක්, නැත්නම් මැරිලා කියලා)

හැබැයි ඇත්තටම නිදාගෙන ඉන්නවා නම් ගැටලුවක් නැහැ.

ඒත් දිගු වෙලාවක් එහෙම ඉන්නවා නම්, වෙව්ලන ගැහෙන ස්වභාවයක් තියනවා නම්, හෝ වෙනත් අසනීප ලක්ෂණ තිබෙනවා නම් වහාම පශුවෛද්‍ය ප්‍රතිකාර සදහා යොමු වෙන්න කියලත් මතක් කරනවා. මොකද එයාලා ලෙඩ හංගන්නත් හරිම දක්ෂයෝ

මේ වගේ අමුතු කතා රැසක් එයාලා ගැන ඉදිරියේදිත් කතා කරනවා. අලුත් ලිපියකින් නැවත හමුවෙමු.!

**#KANDYGUINEAPIGS**
**වත්සලා සෙව්වන්දි**







pet care with wathsala

pink

# උසස් පෙළ ට පසුව
# වෛද්‍ය සිහිනය
# නියතවශයෙන්ම
# සැබෑකරගන්න.

SINCE 1920





ආමේනියාවේ - YSMU
රාජ්‍ය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ
දොරටුව දැන් ඔබට විවෘතයි

- සම්පූර්ණ ඉංග්‍රීසි මාධ්‍ය අධ්‍යාපනය.
- සුරක්ෂිත සාමකාමී ප්‍රමිතිගත රාජ්‍ය වෛද්‍ය විශ්ව විද්‍යාලයකි.
- රුපියල්වලින් ගෙවීමේ හැකියාව

SINCE 2004
QB CAMPUS
We Guarantee Your Future

## 35%
## දක්වා ශිෂ්‍යත්ව.

**SLMC -WHO- AMC - GMC - ECFMG - CAMC - EU අනුමතයි.**

www.ysmu.am - www.ysmu.lk

**0777 855 855 / 0787 855 855**

**මම ගියපාර කැම්පස් එකේ නිවාඩුවට ගෙදර ගියහමයි දැක්කේ අම්මගේ කනේ කරාබු දෙක නැති විත්තිය. මගේ පපුව හෝස් ගාලා ගියා. මොකද කියමනක් තියෙනවානෙ ”ගෑනු කෙනෙක්ගෙ කනේ කරාබු දෙකක් නැත්නම් මිනිහා මැරිච්ච ගෑනි වගේ කියලා.**

ඉතින් මේ පාර නිවාඩුවට ගෙදර යනකොට මට හිතුනා අම්මට කරාබු දෙකක් අරන් යන්න. මොකද අම්මගෙ උපන්දිනය ලග ලගම එන හින්දා එයාට කරාබු දෙකක් තෑගි කරන එක මට හොදයි කියලා හිතුනා .
රත්තරන් කරබු දෙකක් ගන්න තරම් අතේ මිටේ සල්ලි නැති හින්දා කරාබු දෙකක් හොයන්න ෆෙස්බුක් එකේ උඩට පහලට යනකොට තමයි මම

ඇගේ නම සමාධි මල්ෂා මල්ෂා ලක්මාලි.ඇය ඉන්නේ ගණේමුල්ලේ. සමාධිට දැන් වයස අවුරුදු විසි අටක්. ඇයට සහෝදරයන් දෙදෙනෙක් ඉන්නවා. අම්මා ස්වයං රැකියාවක් විදියට රෙදි මහනවා.

” මම පොඩි කාලේ බෝනික්කෙක්ට ආසාවෙන් හිටියා. අපේ අම්මා ඇඳුම් මහන හින්දා පොඩි රෙදි කෑල්ලක් අරගෙන පොඩි රවුම් දෙකක් කපල

# උපාධියක් තිබුණත් මාල හදලත් ගොඩ යන්න පුළුවන්



අහම්බෙන් දැක්කෙ මාල කරාබු හදන යුවතියක් ගැන. ඒවායේ තිබුණු විශේෂත්වය තමයි මේවා හැම එකක්ම හදලා තිබුණේ ස්වාභාවික දේවල් වලින්.ගැහැනු අය කැමති ස්වාභාවික දේවල් වලට.ඉතින් අපි හැමදාම නැගිටින්න වෙර දරන යුවතියන්ට අතහිත දෙනවා නේ ඉතින් අපි අයත් එක්ක ටිකක් කතා බහ කරන්න ඇගේ ගෙදරට ගොඩ වැදුනා.

ඒක මහල ඇතුලට පුලුන් පිරෙව්වා. වූල් නූල් වලින් තමයි එයාගේ එයාගෙ කොණ්ඩෙ දාගත්තේ. මලක් අරගෙන තමයි බෝනික්කාගේ ඇඳුම හදාගත්තේ. කඩවල් වල තියෙන බෝනික්කෝ දැක්කහම මම ගෙදර ඇවිල්ලා ඒ විදිහට හදනවා. ඉතින් මම තාත්තගෙන් ඉල්ලන්න ගියේ නෑ. මොකද ඒව ගන්න සල්ලි නෑනේ.

ඇය කතාව පටන් ගත්තේ එතැනින්. පුංචි කාලේ ඉඳන්ම තමන්ට අවශ්‍ය දේ ඇය විසින්ම නිර්මාණය කරගෙන තියෙන බව ඇය අපට පැවසුවා. පාසල් වැඩ අතපසු නොකර ඇය මේ නිර්මාණ කලාව තුළින් ඉදිරියට යන්න හිතුවේ ඇය පුංචි කාලෙදිමලු.වාණිජ අංශයෙන් උසස් පෙළ විශිෂ්ට ලෙස සමත් වූ ඇයට සරසවි මාතාව කැලණිය විශ්වවිද්‍යාලයට වරම් දුන් බව ඇය අපට පැවසුවා.

” මම විශ්ව විද්‍යාලයේ පළමු වසරේදී තමයි මගේ තාත්තා මිය යන්නේ. එයාගේ එකම ආසාව වුනේ මම හොඳට ඉගෙන ගන්න එක. ඉතින් එයාගෙ බලාපොරොත්තු ඉෂ්ට කරන්න මට පුළුවන් වුණා ”.

තාත්තාගේ මියයාමත් සමග ඇගේ ජීවිතයට තවත් අලුත් පරිච්ඡේදයක් පෙරලමින් ඇය තවත් ශක්තිමත් වුණා. ජිවිතය කොපමණ බාධක අභියෝග ආවත් සාර්ථක ලෙස විශ්ව විද්‍යාලයෙන් මූල්‍ය කළමනාකරණය




පිළිබඳ විශේෂ උපාධියක් ද ලබා ගෙනයි.

" ආයතනයක වැඩ කරන කොට මම හොයපු නිදහස මට ඒකෙන් ලැබෙන්නේ නෑ. ගොඩක් ආතතියෙන් වැඩ කරන්න මම කැමැති නැහැ. ඉතින් ඒ හින්දාම මට හිතුණා මම ආස දෙයකින් ඉදිරියට යන්න.ඒකෙන් මට ආත්ම තෘප්තිය ලැබෙනවා"

හිතේ සතුටින් කරනකොට ඕනෑම දෙයක් සාර්ථක වෙනවයි කියලා කියනවානේ. සමාධිත් බලාපොරොත්තවෙලා තියෙන්නෙ කවදහරි ස්ව ශක්තියෙන් ඉදිරියට යන්න.මොකද ඇයට පොඩි කාලේ ඉඳන් පුංචි පුංචි දේවල් නිර්මාණය කළ හැකියාවක් තිබිලා තියෙනවා. ඉතින් ඇගේ උපාධියටත් සාධාරණයක් ඉෂ්ට කරමින් ඇය කරාබු මාල හදන්න පටන් ගත්තාලු.

" මම මේවා හදන්න ඉගෙන ගත්තේ තනියම.අමුද්‍රව්‍ය වල නම් දන්නෙත් නෑ.පොටෝ පෙන්නලා තමයි මම බඩු හොයාගත්තේ.කොටුවෙ තනියම ඇවිදලා බඩු හොයාගෙන ගෙදර ඇවිල්ලා මට හිතෙන විදිහට මම හදනවා".

ඇය මුලින්ම මාල කරාබු හදන්න ගත්තේ රෙසින් වලින්ලු.පස්සේ අම්මා බතික් නිර්මාණය කරන හින්දා පොඩි පොඩි බතික් රෙදි කෑලි ඇතුලට දාලා කරාබු මාල හැදුවලු. තවත්




අත්හදාබැලීම් කරලා අද වෙද්දි ස්වභාවික මල්, ගල්, සිප්පිකටු, පුංචි පැළෑටි වගේ දේවල් දාලා කරාබු මාල හදනවා කියලයි ඇය අපිට කිව්වේ.

" මම මුලින්ම කළේ මමම හදලා කරාබු මාල දාලා බලපු එක. පස්සේ තමයි මේක ප්‍රසිද්ධ වුණේ. අම්මා අම්මා බතික් ඇඳුම් මහනකොට මම ඒකට ගැලපෙන්න මාල කරාබු හදලා ඉවරයි. ලංකාවේ බතික් වලට හොඳ ඉල්ලුමක් තියනවානේ."

මාල කරාබු වලට අමතරව දැන් ඇය සිහිවටන, කීටැක් වගේ ඒවත් හදනවලු. ඇයගේ මේ සුවිශේෂී නිර්මාණ දැකපු බොහෝ දෙනෙක් ඇයගේ මාල කරාබු ඇණවුම් කළා කියලයි ඇය අපිට කිව්වේ.

" මම මේවා හදද්දී අමුද්‍රව්‍ය හොයා ගන්න කොට ගොඩක් ප්‍රශ්න ආවා.සමහර වෙලාවට බඩු ගන්න ගියහම කඩේ බඩු ඉවරයි. රෙසින් වගේ දේවල් ගෙන්වන්නේ පිටරටින්නේ.
පාරිභෝගිකයා ඉල්ලන දේවල් ඒ විදිහටම හදල දෙන්නත් ඕනේ. එන්ගේජ්මන්ට් වලට ඒම හදනකොට ඇඳුම් සෙරෙප්පු වලට ගැලපෙන විදියට තමයි හදන්න ඕනෙ.
ඉතින් එහෙම ටිකක් අමාරුයි ඒ උනාට වුණාට කොහොම හරි අභියෝග භාර ගෙන කළා. මොකද මගේ වගකීම වෙන්නේ පාරිභෝගිකයාට උපරිමයෙන් සලකන එක".

ඕනෑම දෙයක් කරන්න පටන් ගන්නකොට අභියෝග එන්න පුලුවන්නෙ. ඉතිං ඒ අභියෝග වලට සාර්ථකව මුහුණ දුන් ඇය මේ ව්‍යාපාරය පටන් අරන් මාස අටක් වගේ කෙටි කාලයක් ලු.

අද වෙද්දි ලංකාවේ විතරක් නෙමෙයි පිටරට උදවියත් ඇගෙන් ආභරණ ඇණවුම් කරනවලු ඔන්න.චිනයේ ප්‍රදර්ශනයකට එක් වුණා කියලයි ඇය කිව්වේ.

එතැන හිටිය ලාබාලම තරුණ ව්‍යවසායිකාව ඇයලු.නැවත ස්විස්ටලන්තයේ, ඉන්දියාවේ ප්‍රදර්ශන වලට ප්‍රදර්ශනවලට සහභාගී වීමට ඇයට ඇරයුම් ලැබී ඇති බවත් ඇය අපිට පැවසුවා.

" ව්‍යාපාරය ටික ටික දියුණු වෙද්දි මම රජයේ කුඩා ව්‍යාපාර අංශයට බැඳුනා. එකේ ව්‍යවසායික එකට යන්න මට අවස්ථාව ලැබුණා. ගම්පහ දිස්ත්‍රික්කයේ ආභරණ වලට එක්කෙනයි අරන් තිබුණේ.

ඉතින් මාව ඒකට තේරුණා. මට ලොකු අත්දැකීමක් නැති වුණාට මට ඒ අවස්ථාව ලැබුණා. ඉතින් මම ආභරණ ගොඩක් හදන්න ප්‍රදර්ශනයට අරගෙන ගියා. ඒ ඔක්කොම වගේ විකුණ ගන්න මට පුළුවන් වුණා. මොකද මම කවදාවත් උත්සාහය අත ඇරියේ නෑ.

මට ලොකු විශ්වාසයක් තිබුණ මේ දෙයින් මට දියුණු වෙන්න පුළුවන් කියලා."

ඇගේ ආත්ම විශ්වාසය බලවත් නිසාම නිසා ම ඇය ම ඇය ඇය ගැන ආඩම්බර වෙමින් එසේ පැවසුවා. උත්සාහවන්තයා ජයගනී කියනවනේ ඇයත් උත්සාහවන්ත යුවතියක්. ඇය මේ වෙනකොට ච ටික් ටොක්, ෆෙස්බුක්, යුටියුබ් හරහා ව්‍යාපාර කටයුතු කරන බව ඇය අපට පැවසුවා.දවසට කරාබු ජෝඩු හාරසියක් විතර හදනවලු.

" මට දිගටම හැඳුනු කස්ටමර්ස්ලා ඉන්නවා ඔන්ලයින් ඕඩර් එනවා. ඒ වගේම රටේ යවද්දී හැම මාසෙකම වගේ වෙළඳ ප්‍රදර්ශන තියනවා .ඒවත් එක්ක ආදායම දැන් හොඳයි. හොඳ මට්ටමක තියෙනවා."

සමාධිගේ ව්‍යාපාරය අද වෙද්දී සෑහෙන්න දියුණු වෙලා තියෙනවා. ඇයගේ හැකියාව නිසාම කරාබු මාල ඉක්මනින් විකිනෙන බවයි ඇය අපිට කිව්වේ. ඇයට පිළියට පිළිගත් උප-ාධියක් තිබුණත් ඇය තමා සතු සහජ දක්ෂතාවයෙන් උපරිම ප්‍රයෝජන ගන්න හිතුවේ ඒ නිසයි.ඇය අපේ පාඨකයන්ට ද පණිවුඩයක් දෙන්නට අමතක කළේ නෑ.

" මම තාම තරුණයි.

ව්‍යාපාරයක් කරන්න තරුණ අවධියක තමයි මම ඉන්නේ. ඉතින් රැකියාවක් නැතුව ඉන්න තරුණ තරුණියන්ට මට කියන්න තියෙන්නෙ තියෙන්නේ තමන්ගේ ආස හිතෙන පැත්තක් තෝරගන්න.

අලුත් දෙයක් කරන්න හිතන්න වෙනස් දෙයක් කරන්න ගත්තාම වෙළඳපො-ලේ රැඳිලා ඉන්න පහසුයි. මුලින්ම දෙයක් කරන්න පටන් ගන්නකොට ඒක අමාරුයි කියලා අතාරින්න එපා. කට්ට කාගෙන අල්ලං ඉන්න.

පහසුවෙන් වැඩ කරල සාර්ථක වෙන්න බෑ. අභියෝග බාධක මැඩගෙන ඉදිරියට යන්න ඕනේ".

ඇය කියන විදියට ඇයට අත්දැඅඩු වුණත් ඇය ව්‍යවසායිකාවක් ලෙස ජීවිතයේ ජීවිතය ඉදිරියට ගෙන යාමට ඇයට අවශ්‍ය වුණේම ඒ ආත්ම ශක්තිය.

තමා සතු හැකියා දක්ෂතා සඟවා ගන්නේ නැතුව සමාජයටත් වැඩක් කරන්න තමන්ට ආර්ථික වශයෙන් ප්‍රතිලාභයක් ලබා ගන්න පුළුවන් නම් තමන්ගේ ජීවිතය ජීවිතය සාර්ථක කරගන්න පුළුවන් කියලා ඇගේ කතාව අපිට උදාහරණ කියනවා.

බොහෝ දෙනෙක් තමන්ගේ උපාධිය ලබාගෙන රැකියාවට අරගල කරන යුගයක ඇගේ කතාව උපාධියක් ඇති නැති කෙනෙකුට ආදර්ශයක් වගේම අපේ රටටත් මහත් ආඩම්බරයක්.

ප්‍රාර්ථනා කොඩිකාර



www.cap.lk

FOLLOW US

@CAPCeylon



CAP CEYLON™

CONNECT WITH NATURE




37/E/3, AMBASEWANA AVENUE, KALAGEDIHENA, SRI LANKA

M| +94 777 557 558 W| www.caporganic.com E| info@caporganic.com